වාරිමාර්ග චක්‍රලේඛ අංක:- 03/2024

මගේ අංකය: GA/6/4/12

පාලන ඒකක 06,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

2024.02. 22

අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)/ප්‍රධාන මූල්‍ය නිලධාරී,
අධ්‍යක්ෂ(පරිපාලන) /වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්(ප්‍රධාන කාර්යාලය) /කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්/
යාන්ත්‍රික අධ්‍යක්ෂවරුන්/ප්‍රධාන ගණකාධිකාරීවරුන්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ප්‍රධාන ඉංජිනේරුවරුන් / ගණකාධිකාරීවරුන් / නීති නිලධාරී,
ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරුන්,
පරිපාලන නිලධාරීන්,

**<u>වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තැපැල සම්බන්ධයෙන් කටයුතු විධිමත් කිරීම</u>**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තැපැල සම්බන්ධ කටයුතු වඩා විධිමත් අයුරින් සිදු කොට කාර්යාල කටයුතු වල දී අනවශ්‍ය ප්‍රමාදයන් ඇති වීම වැළැක්වීම සඳහා ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් ප්‍රාදේශීය කාර්යාල අතර ලිපි ගනුදෙනු කිරීමේදී පහත නියමයන් අනුව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

I. ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරන සියලුම ලිපි වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් තනතුර නමින් යොමු කිරීම.
II. ආමන්ත්‍රණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින් යොමු කළ ද, යම් නිලධාරියෙකුගේ පුද්ගලික අවධානයට යොමු කළ යුතු ලිපියක් නම්, ලිපියේ ඉහල වම් කෙළවරේ අවධානයට යොමු කළ යුතු නිලධාරියාගේ තනතුරු නාමය සඳහන් කළ හැකිය.
III. යවන්නාගේ නම, තනතුර පැහැදිලිව සඳහන් කිරීම.
IV. සියලුම ලිපි වල යවන්නාගේ යොමු අංකය මෙන්ම ලබන්නාගේ යොමු අංකය ද සටහන් කර එවීම.
V. බාහිර ආයතනයකට/ පුද්ගලයෙකුට යවන ලිපියක් නම්, ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය.
VI. නිලධාරියෙකු සම්බන්ධව ආයතනික කරුණක් අරභයා යවන ලිපියක් නම් ඔහුගේ/ ඇයගේ නිත්‍ය තනතුරු නාමය සඳහන් කර එවීම. (උදා: විශ්‍රාම ගැන්වීම - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය I සැලසුම් ශිල්පී කේ.සිරිපාල මයා)
VII. පුද්ගලික ලිපිගොනු හා වෙනත් රහස්‍ය ලියවිලි කවර දෙකක බහා යොමු කිරීම. අදාල නිලධාරියා මඟින් පමණක් විවෘත කළ හැකි පරිදි සුදුසු උපදෙස් හා යොමු කිරීම් ද, රහස්‍ය යන කරුණු ද සඳහන් කිරීම.
VIII. තැපැල වෙනුවෙන් දැරීමට සිදුවන පිරිවැය අවම කර ගැනීම සඳහා හැකි සෑමවිටම විද්‍යුත් තැපැල (e-mail) භාවිතා කිරීම.

මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට බලාත්මක වන අතර මෙහි අඩංගු කරුණු සියලු නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

A. Gunasekara

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.